කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

කතෝලික ධර්මය

11 ශ්‍රේණිය කාලය පැය 2 යි

- පහත ප්‍රකාශවලට අදාළ වඩාත් නිවැරදි ප්‍රකාශය යටින් ඉරක් අඳින්න.

01) 'ඉශ්‍රායෙල්' යන්නෙහි අර්ථය ඇත්තේ
i. මොසස්තුමාටය
ii. ඊසක්තුමාටය
iii. ජාකොබ්තුමාටය
iv. ආබ්‍රහම්තුමාටය

02) එලොහිම් සම්ප්‍රදායට අයත් කථාවකි
i. ඊසාක් පූජා කිරීම
ii. නෝවා සමඟ ගිවිසුම
iii. කායින් අයබල් කථා පුවත
iv. නික්මයාම සිද්ධිය

03) හෙබ්‍රෙව් බයිබලයේ මුළු පොත් ගණන,
i. 39
ii. 66
iii. 73
iv. 27

04) 'මාලාබාලයෙකු බැවින් කතා කිරීමට නොදනිමි' මෙසේ ප්‍රකාශ කරන්නේ
i. යෙසායා දිවැසිවරයා
ii. ආමෝස් දිවැසිවරයා
iii. එසකියෙල් දිවැසිවරයා
iv. ජෙරමියා දිවැසිවරයා

05) මාක් ශුභාරංචිය ලියවුනු කාලය
i. ක්‍රි.ව. 80-85
ii. ක්‍රි.ව. 80-90
iii. ක්‍රි.ව. 90-100
iv. ක්‍රි.ව. 64-66

06) දෙවියන් වහන්සේ නෝවා සමඟ ඇතිකරගත් ගිවිසුමේ බාහිර සලකුණ නම්,
i. ජලය
ii. ගිනිවැඹ
iii. දේදුන්න
iv. වර්ෂාව

07) ප්‍රධාන දිවැසිවරයෙක් නොවේ
i. ජෙරමියා
ii. ආබ්‍රහම්
iii. එසකියෙල්
iv. යෙසායා

08) ශුභාරංචි ලියූ එකම අන්‍ය ජාතිකයා
i. ශු.පාවුළුතුමා
ii. ශු.ජොහාන්තුමා
iii. ශු.මාක්තුමා
iv. ශු.ලූක්තුමා

09) කසුන්ගේ මව දහම්පාසලේ ක්‍රියාකාරී දහම් ගුරුවරියකි. ඇය ඉටුකරන්නේ ගිහි ජනතාව සතු,

i. දිවැසිවර සේවය
ii. පූජක සේවය
iii. එඬේරික සේවය
iv. ඉහත කිසිවක් නොවේ

10) 'මතෙටෙස්' යන්නෙහි අර්ථය

i. ගුරුවරයා
ii. ශ්‍රාවකයා
iii. වෙනත් අයෙකුගෙන් ඉගෙනුම ලැබූ තැනැත්තා
iv. ශුභාරංචිය ගැලවීමදායකය

11) පංච පුස්තක හඳුන්වන වෙනත් නමකි

i. ව්‍යවස්ථාවලිය
ii. නීතිය
iii. මොසෙස්ගේ නීතිය
iv. ඉහත සියල්ලම

12) "මා හැර අන් කිසිම දෙවි කෙනෙකු නොසිටිය යුතුය" මෙය සඳහන් වන්නේ,

i. උත්පත්ති පොත
ii. නික්මයාම පොත
iii. ද්විතීය නීති සංග්‍රහය
iv. ලෙවී ව්‍යවස්ථාව

13) "අන්වස්තු ආශා නොකරව" මෙය දස පණතේ

i. හත්වන පණත
ii. අටවන පණත
iii. නවවන පණත
iv. දහවන පණත

14) ජනවන්දනා වර්ෂය නිලවශයෙන් ආරම්භ වන්නේ,

i. ආගමන සමය
ii. නත්තල් සමය
iii. සාමාන්‍ය සමය
iv. පාස්කු සමය

15) ජනවන්දනාවේ ප්‍රධාන අංගයකි

i. දසපණත
ii. භාග්‍ය අට
iii. දිව්‍ය පූජාව
iv. දිව්‍ය සත්ප්‍රසාද මේසය

16) සාමාජීය ප්‍රසාද නිධානයකි

i. දිව්‍ය සත්ප්‍රසාදය
ii. ආශිර්වාදකාර බන්දනය
iii. අභිවෘද්ධි ආලේපය
iv. රෝගීන්ගේ ආලේපය

17) උත්තම පුරුෂ යාච්ඤාවේ ප්‍රධාන කොටස්

i. ~~1 කි~~
ii. 2 කි
iii. 3 කි
iv. 4 කි

18) ස්ත්‍රිය හා පුරුෂයා අතර ඇති සම්බන්ධතාවයේ පදනම වන්නේ

i. ප්‍රේමය
ii. විශ්වාසය
iii. ඉවසීම
iv. තේරුම් ගැනීම

19) උත්පත්ති පොතේ තුන්වන පරිච්ඡේදයේ දැක්වෙන 'සර්පයා' තුළින් සංකේතවත් වන්නේ මිනිසා තුළ ඇති

i. වෛරය
ii. පරිස්සමාව
iii. කෝපය
iv. ඊර්ෂ්‍යා

20) මිසර වැසියන් මුහුණ දුන් වසංගත 10 න් පළමු වසංගතය.

i. වතුර ලේ වීම
ii. මැඩි උවදුර
iii. කිනිතුලු උවදුර
iv. මැසිඋවදුර

e තක්සලාව The National e-learning Portal for The General Education

## 2 - කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

01) කෙටි පිළිතුරු සපයන්න.

i. ශු.බයිබලය රචනා වීමට බලපෑ ප්‍රධාන දේවධාර්මික සම්ප්‍රදා 2 ක් ලියන්න.

ii. දේශක දිවැසිවරු දෙදෙනෙක් නම් කරන්න.

iii. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මගින් කිතුණු සහ සමගිය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ප්‍රකාශන 2 ක් ලියන්න.

iv. දස පණත බෙදෙන ප්‍රධාන කොටස් 2 නම් කරන්න.

v. 'කතෝලිකත්වය' යන්නෙන් අදහස් කරනුයේ කුමක්ද ?

vi. ශු.පාවුළුතුමාගේ දෙවන ධර්මදූතත ගමනට සම්බන්ධ වූ පුද්ගලයින් දෙදෙනෙක් නම් කරන්න.

vii. මුල් කිතුණු සභාවේ ලක්ෂණ 2 ක් ලියන්න.

viii. දිවැසිවරයෙකු යනු ?

ix. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ 2 ක් ලියන්න.

x. 'තියෝපිලස්' යන්නෙහි අර්ථය කුමක්ද ?

02)

i. දිවැසිවරුන් සඳහා භාවිතකරන ග්‍රීක වදන කුමක්ද ?

ii. බයිබලීය දිවැසිවරයා හඳුනා ගත හැකි ව්‍යවහාරික පද මාලාවන් 3 ලියන්න.

iii. ප්‍රසාද ස්නාපනය තුළින් ලද දිවැසිවර කැඳවීම සමාජය තුළ ජීවත් කිරීමට 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන දියණියක ලෙස ඔබට කළ හැකි කාර්යය 5 ක් ලියන්න.

03)

i. කතෝලික බයිබලයෙහි පුරාණ ගිවිසුමට පොත් 7 ක් වැඩිපුර තිබේ. එම පොත් හඳුන්වන නම කුමක්ද ?

ii. එම ග්‍රන්ථ 3 ක් ලියන්න.

iii. සෙප්ටුවාජින්ත පිටපත අපට වැදගත් වන්නේ ඇයි ? පැහැදිලි කරන්න.

04)

i. මැවීමේ කතා 2 නම් කර එය ලියවී ඇති සම්ප්‍රදායන් නම් කරන්න.

ii. ඔබ සඳහන් කල සම්ප්‍රදා 2 ක් එක් සම්ප්‍රදායක් ලක්ෂණ 3 ක් ලියන්න.

iii. 'මැවීම තුළින් දෙවියන්ගේ බලමහිමය පිළිබිඹු වේ' උදාහරණ සහිත ඉදිරිපත් කරන්න.

05)

i. සුභාරංචි දෙකක් නම් කර එහි සංකේත ලියන්න.

ii. එම සුභාරංචි දෙක රචනා වූයේ කිනම් පරමාර්ථයක් මතද ?

iii. සමාජයට ඔබ සුභාරංචියක් වන ආකාරය ලියන්න.

06)

i. සුළු දිවැසිවරු දෙදෙනෙක් නම් කරන්න.

ii. 'ජෙරමියා' යන්නෙහි අර්ථය කුමක්ද?

iii. ජෙරමියා දිවැසිවරයාගේ කැඳවීමෙන් ගත හැකි ආදර්ශ 5 ක් ලියන්න.

07) පහත මාතෘකා 2 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. එසකියෙල් දිවැසිවරයා

ii. ද්විතිය සම්මත ග්‍රන්ථා

iii. ශුභාරංචි සතර

23


1st term test 2016